{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
# Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැ. 3.00 වි.10 |
|---|---|---|

## භූගෝල විද්‍යාව - I

22 S I

පාසලේ නම :- ..............................................

ඇතුළත්වීමේ අංකය :- ..............................................

සැලකිය යුතුයි.

★ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන් විත වේ.

★ පළමු කොටස ප්‍රශ්න හතලියකින් සමන්විත වන අතර ඒ සියල්ලට පිළිතුරු සපයන්න.

★ එක් එක් ප්‍රශ්නයට පිළිතුරු පහ බැගින් ඇති අතර නිවැරදි පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න

★ II කොටසේ ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයිය යුතු අතර III කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයි යුතුය

---

### I - කොටස

01) තිරස් ගුවන් ඡායාරූපයක් ලබාගැනීමේ නිවැරදි ක්‍රමවේදය දැක්වෙන පිළිතුර වන්නේ

1. තීරු දෙකකට පියාසර කිරීම මගින්
2. සාමූහික ඡායාරූපකරණය මගින්
3. කැමරාවේ ප්‍රකාශන අක්ෂය පොළවට ලම්භාකාරව තබා ගැනීමෙන්
4. කැමරා අක්ෂය පොළවට ආනතව තබා ගැනීමෙන්
5. කැමරාවේ ප්‍රකාශන අක්ෂය කෝණිකව තැබීම මගින් (...........)

02) භූමියේ වර්ග කිලෝමීටර් 4 ක ($4\ km^2$) වැවක්, පරිමාණය 1:50000 වන සිතියමක නිරූපණය කරනුයේ වර්ග සෙන්ටිමීටර් ($cm^2$)

1. 8 කිනි  2. 10 කිනි  3. 12 කිනි  4. 15 කිනි  5. 16 කිනි (...........)

03) යම්කිසි අධ්‍යයනයකට අයත් සංගනනය විශාල වන විට දත්ත රැස් කිරීම කරනු ලබන්නේ

1. නිරීක්ෂණයෙනි  2. මූලාශ්‍ර මගිනි  3. නියැදියක් මගිනි
4. ප්‍රශ්නාවලියක් මගිනි  5. මිනුම් මගිනි (...........)

04) පොළව මට්ටමේ සිට කි.මී. 700-1500 අතර උන්නතාංශයකින් ගමන් ගන්නා අභ්‍යාවකාශ වේදිකා වර්ගය කුමක්ද?

1. පහළ මට්ටමේ චන්ද්‍රිකා  2. ඉහළ මට්ටමේ චන්ද්‍රිකා  3. අජටාකාශ යානා
4. අජටාකාශ මධ්‍යස්ථාන  5. අභ්‍යවකාශ මධ්‍යස්ථාන (...........)

05) දත්ත ව්‍යාප්තියක අපකිරණය යනුවෙන් අදහස් කරන්නේ

1. සංඛ්‍යාත ව්‍යාප්තියක පංති ප්‍රාන්තරවල සංඛ්‍යාතය ප්‍රස්තාරගත කළවිට ලැබෙන ස්ථම්භවල මධ්‍ය ලක්ෂ්‍යයන්ය
2. දත්ත ව්‍යාප්තියක මධ්‍යනායේ සිට එකිනෙක අගයන් විචලනය වන ආකාරයයි
3. දත්ත ව්‍යාප්තියක කේන්ද්‍රික අගයේ සිට විසිරී ඇති ආකාරයයි
4. දත්ත ව්‍යාප්තියක මුළු එකතුව දත්ත සංඛ්‍යාවෙන් බෙදූ විට ලැබෙන අගයයි
5. විචල්‍යයක කිසියම් අගයකින් ඉහළ හෝ පහළ හෝ සංඛ්‍යාතයයි (...........)

06) සමුච්ත ප්‍රතිශත වක්‍රය මේ නමින් ද හඳුන්වයි

1. ජාල රේඛය 2. සංඛ්‍යාත බහු අශ්‍රය 3. ඔගිවිය 4. විසරණ සටහන 5. සක් සටහන (..........)

07) 1: 50000 සිතියම්වල සූචකයේ සඳහන් විවිධ තොරතුරු ප්‍රධාන ශිර්ෂ කීයක් යටතේ දක්වා තිබේද?

1. 6 ක් 2. 7 ක් 3. 8 ක් 4. 9 ක් 5. 10ක් (..........)

08) සනත්වය හා අවකාශීය ව්‍යාප්තිය දැක්වීම සඳහා වඩාත් යෝග්‍ය ශිල්ප ක්‍රමය කුමක්ද?

1. සේයා සිතියම 2. ධාරා සිතියම 3. සරල තීරු ප්‍රස්තාරය

4. සැසඳුම්තීරු ප්‍රස්තාරය 5. ඒකාබද්ධ රේඛා හා තීරු ප්‍රස්තාරය (..........)

09) සිතියම් පත්‍ර දෙකක් එකතුකොට එක් පත්‍රයක් ලෙස මුද්‍රණය කර ඇති ශ්‍රී ලංකා 1:50000 සිතියම් 2 කි

1. මන්නාරම හා තාලේමන්නාරම 2. ඉරනමඩු හා මුලතිව් 3. වාකනේරි හා කල්කුඩා

4. මනිපායි හා පේදුරුතුඩුව 5. අම්පාර හා කල්මුණේ (..........)

10) භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට අදාල ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ

1. හවායි දූපත්වලය 2. කොලරාඩෝවලය 3. දියාගෝගාෂියාවලය


4. ක්වායලෙයින්වලය 5. ඇසෙන්ෂන්වලය (..........)

11) ඩේවිස්ගේ ඛාදන වක්‍රයේ වෘද්ධ අවස්ථාවේදී හඳුනාගත හැකි භූ රූප දෙකකි

1. දිය ඇළි හා ගං දගර 2. දුනු විල් හා සානු 3. දුනු විල් හා ගං දගර

4. දිය ඇළි හා ලම්භ නිම්න 5. සානු හා V හැඩ නිම්න (..........)

12) පහත රූප සටහනින් දැක්වෙන්නේ වායුගෝලයේ සෛල තුනක ආකෘතියකි. සමකයේ සිට ධ්‍රැව දක්වා එම සෛලවල නිවැරදි අනුපිළිවෙළ සඳහන් වන ප්‍රකාශය කුමක්ද?




1. ධ්‍රැවක සෛලය, හැඩ්ලි සෛලය, ෆෙරල් සෛලය
2. ධ්‍රැවක සෛලය, ෆෙරල් සෛලය, හැඩ්ලි සෛලය
3. ෆෙරල් සෛලය, හැඩ්ලි සෛලය, ධ්‍රැවක සෛලය
4. හැඩ්ලි සෛලය, ධ්‍රැවක සෛලය, ෆෙරල් සෛලය
5. හැඩ්ලි සෛලය, ෆෙරල් සෛලය, ධ්‍රැවක සෛලය

(..........)

13) ශ්‍රී ලංකාවේ ඉඳුරුව හා කයිකාවල වෙරළබඩ ප්‍රදේශවල ව්‍යාප්තව ඇති බලශක්ති ඛණිජය කුමක්ද?

1. තෝරියනයිට් 2. පීට් 3. ග්‍රීට් 4. මොනසයිට් 5. පීර්ණක (..........)

14) මහාද්වීපික ග්ලැසියර මගින් නිර්මාණය වන නිධි සාධිත භූරූප දෙකක් නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කුමන පිළිතුරෙහිද?

1. එස්කර හා කේම 2. විෂම ප්‍රාන්ත හෙල සහ සර්ක්

3. රොෂ්මුටොන්නේ සහ සර්ක 4. අරේට හා රොෂ්මුටොන්නේ

5. විෂම ප්‍රාන්ත හෙල හා අරේට (..........)

15) ජෛන්ද්‍රීය අවසාදිත පාෂාණ වර්ග දෙකක් නිවැරදි ව දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහිද?

1. කාබනේට් හා පිප්සම් 2. ලිමොනයිට් හා හෙමටයිට්

3. පීට් හා ගල් අඟුරු 4. බ්‍රෙෂියා හා බොරළු

5. ගිනිගල් හා ශල්ක (..........)

16) යමහල් දූපත් චාප නිර්මාණය වන ආකාරය දැක්වෙන්නේ කවර පිළිතුරෙහිද?
1. මහාද්වීපික තැටියක් යටින් සාගරික තැටියක් ගමන් කිරීමෙනි
2. සාගරික තැටියක් ප්‍රාවරණය තෙක්ම තල්ලුවී ගොස් පාෂාණ තැටිය උණුවීමෙනි
3. භූතැටි දෙකක් එකිනෙකට ඇතිල්ලී යන ලෙස ගමන් කිරීමෙනි
4. සාගරික තැටි දෙකක් එකට ගැටීමෙනි
5. භූ තැටි දෙකක් දෙපසට ගමන් කිරීමෙනි (..........)

17) හරිතාගාර වායුවක් නොවේ
1. මීතේන් 2. නයිට්‍රස් ඔක්සයිඩ් 3. කාබන් ඩයොක්සයිඩ්
4. ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් 5. හයිඩ්‍රජන් (..........)

18) ශ්‍රී ලංකාවේ ඇති වන ජීවී රක්ෂිත වර්ග අතරින් "දැඩි රක්ෂිත" ගණයට අයත්වන්නේ කුමක්ද?
1. ත්‍රිකෝණමඩු 2. වස්ගමුව 3. බුන්දල
4. ආනවිලුන්දාව 5. හක්ගල (..........)

19) උතුරු අත්ලන්තික් සාගරය ආශ්‍රිතව ක්‍රියාත්මකවන සුළි සුළං හඳුන්වන්නේ කුමන නමකින්ද?
1. බැගියෝ නමිනි 2. හරිකේන් නමිනි 3. විළිවිලිස් නමිනි
4. ටයිපූන් නමිනි 5. ටොනේඩෝ නමිනි (..........)

20) පෘථිවි අභ්‍යන්තරයේ අවසාදිත තට්ටු අතර තැන්පත්වී ඇති ජලය හඳුන්වන්නේ කෙසේද?
1. උල්කා ජලය නමිනි 2. මැග්මීය ජලය නමිනි 3. කේශාකර්ශන ජලය නමිනි
4. සහජාත ජලය නමිනි 5. කඨින ජලය නමිනි (..........)

21) මධ්‍ය උෂ්ණත්වය $18^0C$ කට වැඩිය. ශීත ඍතුවක් නැත. වාර්ෂික වර්ෂාපතනය අධික වන අතර, එය වාර්ෂික වාෂ්පීකරණය ඉක්මවායයි. මින් අදහස් වන දේශගුණ වර්ගය කුමක්ද?
1. නිවර්තන දේශගුණ වර්ග 2. වියළි දේශගුණ වර්ගය
3. උණුසුම් සෞම්‍ය දේශගුණ වර්ගය 4. ශීත දේශගුණ වර්ගය
5. ධ්‍රැව දේශගුණ වර්ගය (..........)

22) හයිග්‍රෝමීටරය භාවිතා කරනු ලබන්නේ කුමන කාලගුණික තත්වයක් මිනුම් කිරීමට ද?
1. සුළඟේ වේගය 2. වායුගෝලීය පීඩනය 3. ආර්ද්‍රතාවය
4. උෂ්ණත්වය 5. පතන ශීඝ්‍රතාවය (..........)

23) කිරිගරුඬ හෙවත් මාබල් පාෂාණයේ මව් පාෂාණය ක්‍රමයක්ද?
1. ග්‍රැනයිට් 2. හුණුගල් 3. වැලිගල් 4. සිස්ට් 5. බොරළු
(..........)

24) දෙවන සනයේ භූ රූපයකට නිදසුනක් වන්නේ කවරක්ද?
1. මහාද්වීප 2. V හැඩ නිම්න 3. මධ්‍ය සාගරික වැටි
4. සාගර ද්‍රෝනි 5. අරේට (..........)

25) ආතතිය බලවේග හේතුවෙන් නිර්මාණය වන භූරූප දෙකක් දැක්වෙන්නේ පහත කුමන වරණයෙහිද?
1. සමමිතික නැමි හා සෝපාන විභේද 2. අසමමිතික නැමි හා සාමාන්‍ය විභේදය
3. උඩුකුරු විභේදය හා ඒකානති නැමි 4. ඔත්නැම්ම හා සුවිභේද නිම්නය
5. සුවිභේදය හා හෝස්ට් විභේදය (..........)

26) එල්නිනෝ සංසිද්ධිය ඇති කිරීමට බලපාන සාධක නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහිද?

1. නැගෙනහිර පැසිෆික් සාගරය උණුසුම් වීමෙන් අසාමාන්‍ය කාලගුණික රටාවක් නිර්මාණය වීම
2. නිරිතදිග පැසිෆික් සාගරයේ අසාමාන්‍ය ලෙස ශීත සාගරික ජල තලයක් නිර්මාණය වීම
3. අත්ලන්තික් සාගරයේ කාලගුණ රටාවේ සිදුවන ඍතුමය වෙනස්වීම
4. පැසිෆික් සාගරයේ කාලගුණික රටාවේ සිදුවන දෛනික වෙනස්වීම
5. අත්ලන්තික් සාගරයේ අසාමාන්‍ය කාලගුණ රටාව (..........)

27) • උපත් අනුපාතිකය ඉහළය
• ආයු අපේක්ෂාව පහළය
• මරණ අනුපාතය පහළය

ඉහත සඳහන් තොරතුරු ආශ්‍රිතව හඳුනාගත හැක්කේ කවර ආකාරයේ වයස් පිරමීඩයක්ද?

1. හායන 2. ස්ථාවර 3. සංකෝචන 4. ප්‍රාථමික 5. ප්‍රසාරණ (..........)

28) පහත සඳහන් රටවල් අතරින් අවම නාගරීකරණ මට්ටමක් සහිත රට කුමක්ද?

1. සිංගප්පූරුව 2. ශ්‍රී ලංකාව 3. කටාර් 4. ග්වාඩලූප් 5. ක්වේට් (..........)

29) වැවක්,මාළිගාවක් හෝ වෙළඳපළක් කේන්ද්‍ර කරගෙන විධිමත් බවකින් යුක්තව බිහිවී ඇති ජනාවාස හඳුන්වන්නේ කෙසේද?

1. නාභිගත ජනාවාස නමිනි
2. සැළසුම්ගත ජනාවාස නමිනි
3. රේඛීය ජනාවාස නමිනි
4. නිහැඩ ජනාවාස නමිනි
5. විකීර්ණ ජනාවාස නමිනි (..........)

30) එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහනේ (UNEP) මූලස්ථානය පිහිටුවා ඇත්තේ කොහේද?

1. බ්‍රසීලයේ රියෝද ජැනයිරෝ නුවර
2. තායිලන්තයේ බැංකොක් නුවර
3. ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර
4. කෙන්යාවේ නයිරෝබි නුවර
5. පිලිපීනයේ මැනිලා නුවර (..........)

31) ජනාවාස ධූරාවලිය මගින් දක්වනු ලබන්නේ කුමක්ද?

1. ජනාවාසවල විවිධත්වයයි
2. ජනාවාස වල අනුපිළිවෙළයි
3. ජනාවාස වර්ගයයි
4. ජනාවාසවල විශාලත්වයයි
5. ජනාවාස අතර දුරයි (..........)

32) වර්තමානය වන විට ලෝක කෘෂිකර්මාන්තයේ ඒකාධිකාරය හිමිකරගෙන ඇත්තේ

1. සංවර්ධිත රටවල ජාන තාක්‍ෂණවේදීන්ය
2. ජාත්‍යන්තර වාණිජ බැංකුකරුවන්ය
3. දියුණු රටවල ගොවීන්ය
4. බහු ජාතික සමාගම්ය
5. සෘජු විදේශ ආයෝජකයින්ය (..........)

33) අන්තර්ජාතික සංක්‍රමණ හේතුවෙන් ප්‍රභව රටවල් මුහුණපාන සෘණාත්මක බලපෑමක් නොවේ

1. රට තුළ ආහාර, රැකියා හා සෞඛ්‍ය සේවා සඳහා ඇති ඉල්ලුම අඩුවීම
2. තරුණ ශ්‍රමිකයින් හා ව්‍යවසායකයින් අහිමි වීමෙන් සංවර්ධනය මන්දගාමී වීම
3. විවාහ අනුපාතය අඩුවීම හා පවුල් සම්බන්ධතා බිඳ වැටීම
4. රටෙහි යැපෙන්නන්ගේ ප්‍රතිශතය ඉහළ යාම
5. බුද්ධිගලනය හේතුවෙන් ආර්ථික සංවර්ධනය අඩාල වීම (..........)

34) එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනෙහි වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති ජීවීන් වෙළඳාම පිළිබඳව විශේෂ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත්තේ කුමන නගරයෙහිද?

1. පිලිපීනයේ මැනිලාහිය
2. ජර්මනියේ බොන්හිය
3. ස්විට්සර්ලන්තයේ ජිනීවාහිය
4. ප්‍රංශයේ පැරිසියෙහිය
5. ඉන්දියාවේ නවදිල්ලි හිය

(...........)

35. කාබන් ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතින, උසස් තත්වයේ ගල් අඟුරු ලෙස සැලකෙන්නේ කුමන වර්ගයද?

1. ජතු ගල් අඟුරු
2. ප්‍රජතු ගල් අඟුරු
3. කාෂ්ඨීක ගල් අඟුරු
4. පීර්ණක ගල් අඟුරු
5. පීට්

(...........)

36. ශ්‍රම ගුක්ෂම කර්මාන්තයක් නොවේ

1. නැව් තැනීම
2. රෙදිපිළි
3. ගුවන්යානා
4. අවි ආයුධ
5. යකඩ හා වානේ

(...........)

37. දකුණු ආසියා කලාපීය සහයෝගිතා සංවිධානය පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක්ද?

1. සියළු සාමාජික රටවල ජනතාව, භාණ්ඩ හා සේවා, ප්‍රාග්ධන ඒකීය වෙළඳපොලක් යටතේ නිදහස් තත්වයට පත් කිරීම ප්‍රධාන අරමුණ විය.
2. ඒකාබද්ධ ආර්ථික ක්‍රමයක් සාමාජික රටවල ක්‍රියාත්මක කිරීම මූලික අරමුණ විය
3. 1993 වර්ෂයේ දී සාමාජික රටවල් 26 ක මූලිකත්වයෙන් ආරම්භ කර ඇත.
4. 1967 දී තායිලන්ත බැංකොක් නගරයේදී පිහිටුවන ලදී.
5. මෙම සංවිධානය නිල වශයෙන් ආරම්භ කරන ලද්දේ 1985 වර්ෂයේ දී බංගලාදේශයේ ඩකා හි දීය

(...........)

38. දේශගුණ විද්‍යාත්මක උපද්‍රවයක් ලෙස සැලකේ

1. නාය යෑම
2. හිම කඳු ප්‍රපතනය
3. ගිනි කඳු
4. සුනාමි
5. භූමිකම්පා

(...........)

39. 
- ශාක කඳක් මත මල් හා ඵල හටගැනීම දක්නට ලැබේ
- බිම් ස්ථරයට ආලෝකය විහිදෙන ප්‍රමාණය අඩු හෙයින් යටිරෝපණය දුර්වලය
- සාපේක්ෂ ආර්ද්‍රතාවය ඉහළ අගයක් ගනී
- බැබූන්, චිම්පන්සියා, ඇනකොණ්ඩා වැනි සත්වයින් දැකගත හැකිය

ඉහත ලක්ෂණවලින් සමන්විත වන බියෝමය කුමක්ද?

1. ටයිගා වනාන්තර
2. සෞම්‍ය කලාපීය වනාන්තර
3. මධ්‍යධරණී වන ලැහැබ්
4. නිවර්තන වර්ෂා වනාන්තර
5. තෘණ භූමි හා සැවානා

(...........)

40. හරිත විප්ලවයේ ආරම්භක රට ලෙස සැලකෙන්නේ කුමක්ද?

1. ජපානය
2. පිලිපීනය
3. මෙක්සිකෝව
4. බ්‍රසීලය
5. ඇමරිකා එක්සත් ජනපදය

(...........)

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }



**උපදෙස් :-**

- ★ ii කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතුය
- ★ iii කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- ★ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50000 භූ ලක්ෂණ සිතියමක කොටසක් සහ ලෝක ආකෘති සිතියමක් සපයනු ලැබේ.

## II කොටස

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 1: 50000 පරිමාණයේ මතුගම භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය 20m කි. මෙම සිතියම පදනම් කරගෙන පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි**

- ★ **පිළිතුරු සිතියමේ නොලිය යුතුය**
- ★ **ප්‍රශ්න අංකය** සහ අදාළ **උපකොටස් වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලිවිය යුතුය.
- ★ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයේ ඇල විය යුතු **නොවේ.**

(i) සිතියමෙහි A,B,C හා D චතුරස්‍රය තුළ ලකුණු කර ඇති භෞතික ලක්ෂණ නම් කරන්න. (ලකුණු02)

(ii) සිතියම් ප්‍රදේශය තුළ දැකිය හැකි ප්‍රධාන භූමි පරිහරණ වර්ග හතරක් නම් කරන්න. (ලකුණු02)

(iii) සිතියම් ප්‍රදේශයේ E හා F රේඛාව ඔස්සේ හරස් කඩක් අඳින්න (ලකුණු04)

(iv) සිතියම් ප්‍රදේශයේ H අක්ෂරයෙන් දැක්වෙන කොටුව තුළ වූ භූමි ප්‍රමාණය 1:100000 පරිමාණයට දැක්වීම සඳහා චතුරස්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු02)

(v) සිතියම්ගත ප්‍රදේශයේ ජල වහන රටාවේ ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු04)

(vi) සිතියම් ප්‍රදේශයේ භූ විෂමතාව භූමි පරිහරණ කටයුතු කෙරෙහි බලපා ඇති අයුරු ප්‍රධාන සාධක තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු06)

2. සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් පහත සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

(i) ඊශ්‍රායලය

(ii) තායිවාන් දූපත

(iii) පර්ත් නගරය

(iv) ටැංගනිකා විල

(v) බාස් සමුද්‍ර සන්ධිය

(vi) යෙනිසි ගංගාව

(vii) බෙංගුවෙලා ප්‍රවාහය

(viii) ඇල්ප්ස් කඳු

(ix) එක්සත් ජාතීන්ගේ දේශගුණ සමුළුව (COP 27 ) පැවැත් වූ රට

(x) දකුණු ආසියාතික සහයෝගිතා පාරිසරික වැඩ සටහනේ (SACEP) මූලස්ථානය පිහිටි රට

## III - කොටස

3. (i) ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ භාවිතා වන ක්‍රම ශිල්ප හතරක් නම් කරන්න (ලකුණු02)

(ii) තේමා සිතියම් නිර්මාණය කරන ක්‍රම තුනක් සඳහන් කොට ඉන් එක් ශිල්ප ක්‍රමයක් තෝරාගෙන ඒ ආශ්‍රයෙන් තේමා සිතියම් සකස් කරන ආකාරය කෙටියෙන් පහදන්න (ලකුණු06)

(iii) ඔබ තෝරාගත් ක්‍රමයේ වාසි දෙකක් හා අවාසියක් කෙටියෙන් සාකච්චා කරන්න. (ලකුණු03)

(iv) ප්‍රායෝගික භූගෝල විද්‍යා ක්‍රම ශිල්ප භාවිතයට ගැනෙන අවස්ථා දෙකක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න. (ලකුණු04)

4. (i) නවීන සිතියම් විද්‍යාව යනු කුමක්ද? (ලකුණු02)

(ii) නවීන සිතියම් විද්‍යාව ප්‍රචලිතවීමට බලපෑ හේතු 3 ක් දක්වන්න (ලකුණු03)

(iii) අංකිත සිතියමක හා දෛශික සිතියමක ලක්‍ෂණ 2 බැගින් ලියන්න. (ලකුණු04)

(iv) භූගෝලීය තොරතුරු පද්තියක (GIS) මූලික සංරචක තුනක් දක්වා ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු06)

5, 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ දිස්ත්‍රික්ක මට්ටමේ ව්‍යාප්තිය වගුව 01 හි දැක්වේ.
වගුව 01 :- ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ ව්‍යාප්තිය 2019 (සිද්ත්‍රික්ක මට්ටමෙන්)

| අනු අංකය | දිස්ත්‍රික්කය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 20718 |
| 02 | ගම්පහ | 16573 |
| 03 | කළුතර | 8395 |
| 04 | ගාල්ල | 7378 |
| 05 | මාතර | 4054 |
| 06 | හම්බන්තොට | 2049 |
| 07 | රත්නපුර | 4086 |
| 08 | කෑගල්ල | 2716 |
| 09 | කුරුණෑගල | 3218 |
| 10 | පුත්තලම | 2257 |
| 11 | මහනුවර | 8940 |
| 12 | මාතලේ | 2445 |
| 13 | නුවරඑළිය | 438 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 14 | බදුල්ල | 1922 |
| 15 | මොණරාගල | 333 |
| 16 | යාපනය | 8261 |
| 17 | කිලිනොච්චිය | 396 |
| 18 | වවුනියාව | 872 |
| 19 | මුලතිව් | 268 |
| 20 | මන්නාරම | 271 |
| 21 | අනුරාධපුර | 1164 |
| 22 | පොළොන්නරුව | 561 |
| 23 | ත්‍රිකුණාමලය | 2969 |
| 24 | මඩකලපුව | 2848 |
| 25 | අම්පාර | 338 |
| | ශ්‍රී ලංකාව | 103470 |

මූලාශ්‍රය :- වසංගත රෝගවේද ඒකකය ශ්‍රී ලංකාව (2020)

(i) වගුව 1 හි දැක්වෙන දත්ත වලින් පෙන්නුම් කෙරෙන ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ දිස්ත්‍රික්ක මට්ටමේ ව්‍යාප්තියෙහි කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඉහත දත්ත පදනම් කරගෙන පන්ති ප්‍රාන්තර ප්‍රගණන ලකුණු, සංඛ්‍යාතය, සමුච්චිත සංඛ්‍යාතය, සහ ප්‍රතිශතක සම්චුචිත සංඛ්‍යාතය ඇතුලත් වගුවක් සකස් කරන්න. (පන්ති ප්‍රාන්තර පරතරය 4200 ලෙස සලකන්න. පළමු පංතියේ ආරම්භක අගය ශුන්‍යවිය යුතුය) (ලකුණු 05)

(iii) ඉහත (ii) හි ඔබ සකස් කළ වගුව දනම් කරගෙන ප්‍රතිශතක සමුච්චිත සංඛ්‍යාත වක්‍රයක් නිර්මාණය කරන්න. (ප්‍රස්තාර කොළ භාවිත කරන්න) (ලකුණු 05)

(iv) ප්‍රතිශත සමච්චිත සංඛ්‍යාත වක්‍රයෙහි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 03)

06) 2010 - 2013 කාලය තුළ ශ්‍රී ලංකාවේ ඛණිජ වැලි වර්ග කිහිපයක අපනයන ඉපැයීම් (රුපියල් මිලියන ආසන්න සංඛ්‍යාවට වැටයු ) පහත වගුවේ දැක්වේ

වගුව 2 ඛණිජ වැලි වල අපනයන ඉපැයීම් 2010 - 2013


| **ඛනිජ වර්ගය** | **2010** | **2011** | **2012** | **2013** |
|---|---|---|---|---|
| ඉල්මනයිට් | 562 | 1497 | 2999 | 713 |
| රූටයිල් | 233 | 332 | 1073 | 158 |
| සර්කෝන් | 203 | 123 | 161 | 130 |

මූලාශ්‍රය Sri Lanka Minerals

(i) ඉහත වගුවෙහි දැක්වෙන දත්ත නිරූපනය සඳහා බහු රේඛා ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවේ ඛනිජ වැලි ආශ්‍රිත අපනයන ඉපැයීම්වල කැපී පෙනෙන ලක්ෂණ හතරක් ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරයේ නිදර්ශන සහිතව බහු රේඛා ප්‍රස්තාරයක සුවිශේෂී ගුණාංග තුනක් දක්වන්න. (ලකුණු 03)






SCALE 1:50 000

සමෝච්ච රේඛා අන්තරය මීටර් 20
Contour Interval 20m

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
**Department of Education – North Central Province**

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැ. 3.00 මි.10 |
|---|---|---|

## භූගෝල විද්‍යාව - II

පාසලේ නම :- ..................................................

ඇතුළත්වීමේ අංකය :- ..................................................

| 22 | S | II |
|---|---|---|

★ අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි

★ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (5) පිළිතුරු සපයන්න.

### I - කොටස- භෞතික භූගෝල විද්‍යාව

01. (i) යමහළක් නිර්මාණය වන්නේ කෙසේද? (ල.02)

(ii) ආක්‍රාන්ත හා නිෂ්ක්‍රාන්ත භූ රූප දෙකක් නම් කර ඒවායේ නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ල.06)

(iii) යමහල්කරණයේ හිතකර බලපෑමක් ද අහිතකර බලපෑම් දෙකක් ද පැහැදිලි කරන්න. (ල.06)

iv) භූ තැටි මායිම් ආශ්‍රිතව සිදුවන චලන ස්වභාවයන් දෙකක් සාකච්ඡා කරන්න. (ල.06)

02. (i) භූ විද්‍යාත්මක හා දේශගුණ විද්‍යාත්මක උපද්‍රව දෙකක් පිළිවෙලින් නම් කරන්න. (ල.02)

(ii) උපද්‍රව හා ආපදා අතර වෙනස පැහැදිලි කරන්න. (ල.06)

(iii) ස්වාභාවික උපද්‍රවයක් තෝරාගෙන එය තීව්‍ර කිරීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ල.06)

(iv) ඔබ ඉහත ප්‍රශ්න අංක (iii) හි තෝරාගත් ස්වාභාවික ආපදාවය අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් සාකච්ඡා කරන්න. (ල.06)

03. (i) ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක හතරක් නම් කරන්න. (ල.02)

(ii) ඔබ (i) හි සඳහන් කළ සාධක අතුරෙන් දෙකක් තෝරාගෙන ඒවා ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල.06)

(iii) දේශගුණ වෙනස්වීම් කෙරෙහි බලපාන භෞතික ක්‍රියාවලි තුනක් සාකච්ඡා කරන්න. (ල.06)

(iv) දේශගුණ විපර්යාස මගින් ඇතිවන හානි අවම කිරීමට ගෝලීය මට්ටමින් ගෙන ඇති පියවර තුනක් සාකච්චා කරන්න. (ල.06)

04. (i) ලෝකයේ ප්‍රධාන බියෝම හතරක් නම් කරන්න. (ල.02)

(ii) ඔබ ඉහත (i) හි නම් කළ එක් බියෝමයක කැපී පෙනෙන ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ල.06)

(iii) වර්තමානයේ බියෝම මුහුණපාන ගැටළු තුනක් විස්තර කරන්න. (ල.06)

(iv) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති සංරක්ෂණය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් සාකච්ඡා කරන්න. (ල.06)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05) i) ගෝලීයකරණය යනු කුමක්ද? (ල.02)

ii) ගෝලීයකරණයේ ප්‍රධාන වාහක තුනක් පරීක්ෂා කරන්න. (ල.06)

iii) සංවර්ධනය වෙමින් පවතින රටවලට ගෝලීයකරණය නිසා ඇතිවන යහපත් බලපෑමක් හා අයහපත් බලපෑමක් විස්තර කරන්න. (ල.06)

iv) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා ගෝලීයකරණය දායක වී ඇති ආකාරය නිදසුන් තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ල.06)

06) i) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංක්‍රමණය නිර්වචනය කර ඇත්තේ කෙසේද? (ල.02)

ii) සංක්‍රමණ වර්ග දෙක කෙටියෙන් හඳුන්වන්න (ල.06)

iii) සංක්‍රමණය හේතුවෙන් රටකට මුහුණපෑමට සිදුවන ධනාත්මක හා ඍණාත්මක ප්‍රතිඵල දෙක බැගින් නම්කර, එය ගමනාන්ත රටවලට බලපාන ආකාරය විස්තර කරන්න. (ල.06)

iv) මෑත කාලීනව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංක්‍රමණ වර්ධනය වීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය. ඒ සඳහා බලපා ඇති සාධක තුනක් නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න. (ල.06)

07) වගු අංක 1 හි ඇතුළත් වන්නේ 1950 සිට 2050 දක්වා කාල පරිච්ඡේදය තුළ ලෝකයේ නාගරීකරණය පිළිබඳ දත්ත වේ.

| කලාපය | නාගරීකරණ ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|
| | 1950 | 1970 | 1990 | 2014 | 2030 |
| ලෝකය | 20.5 | 30.6 | 42.9 | 53.6 | 60.0 |
| අප්‍රිකාව | 14.0 | 22.6 | 31.3 | 40.0 | 47.1 |
| ආසියාව | 17.5 | 23.7 | 32.3 | 47.5 | 56.3 |
| යුරෝපය | 51.5 | 63.0 | 70.0 | 73.4 | 77.0 |
| ලතින් ඇමරිකාව හා කැරිබියන් කලාපය | 41.3 | 57.1 | 70.5 | 79.5 | 83.0 |
| උතුරු ඇමරිකාව | 63.9 | 73.8 | 75.4 | 81.5 | 84.2 |
| ඕෂනියාව | 62.4 | 71.3 | 70.7 | 70.8 | 71.3 |

වගු අංක - 1 මූලාශ්‍රය World Urbanization Prospects - 2014

i) නාගරීකරණය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න (ල.02)

ii) ඉහත වගුවෙහි දක්වා ඇති දත්ත වලින් හෙළිවන නාගරීකරණයේ ගතිලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල.06)

iii) නාගරීකරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

iv) ශ්‍රී ලංකාවේ නාගරීකරණය හේතුවෙන් පැනනැගී ඇති ගැටළු දෙකක් පැහැදිලි කර, එම ගැටළු විසඳීමට රජය විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ල.06)

08) i) සංචාරක කර්මාන්තයේ භෞතික පදනම හා මානවජන්‍ය පදනමට අයත් සාධකය බැගින් පිළිවෙලින් සඳහන් කරන්න. (ල.02)

ii) ශ්‍රී ලංකාවේ සංචරණයේ ප්‍රභේද තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.06)

iii) සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ සමාජීය හා සංස්කෘතික, ආර්ථික හා පාරිසරික අංශවල පැන නැගී ඇති අයහපත් බලපෑම් තුනක් විස්තර කරන්න. (ල.06)

v) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්ධනයට ගතහැකි ක්‍රියා මාර්ග තුනක් සාකච්ඡා කරන්න. (ල.06)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore



# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න